// ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශේෂ

අංක 2510/14 - 2026 ඔක්තෝබර් මස 12 වැනි සඳුදා - 2026.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී- බී 7/2001(VI)

**1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත**

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වන වගන්තිය යටතේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**එච්. එම්. විජිත හේරත්,**
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය.

2026 ඔක්තෝබර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

2012 මැයි මස 15 වැනි දින අංක 1758/19 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2012 අංක 1 දරන එක්සත් ජාතීන්ගේ නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) 5 වන නියෝගයේ -

(අ) (1) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(1) කිසිම තැනැත්තකු විසින්, යම් නම් කරන ලද ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් සතු හෝ නම් කරන ලද ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් විසින් සම්පූර්ණයෙන් ම හෝ හවුලේ අයිතිය දරන, දරනු


*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලබන හෝ පාලනය කරනු ලබන හෝ, ඒ නම් කරන ලද ස්වාභාවික හෝ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය සඳහා සහ ඒ වෙනුවෙන් හෝ, ඒ නම් කරන ලද ස්වාභාවික හෝ නෛතික තැනැත්තාගේ, කණ්ඩායමේ හෝ අස්ථිත්වයේ විධානය පරිදි වෙනත් යම් තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් සතු, හෝ සම්පූර්ණයෙන් ම හෝ හවුලේ අයිතිය දරන, දරනු ලබන හෝ පාලනය කරනු ලබන යම් අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් සමඟ ගනුදෙනු කරනු නොලැබිය යුතු ය. ඒ ස්වාභාවික හෝ නෛතික තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය නම් කරනු ලැබ ඇති තාක් කල් ඒ අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් ක්‍රියාවිරහිතව පැවතිය යුතු ය:

එසේ වුවද, බැර කරන ලද අරමුදල් ක්‍රියාවිරහිත කරනු ලබන තාක් දුරට, ක්‍රියාවිරහිත කරන ලද ගිණුම මත ලැබිය යුතු පොළිය හෝ වෙනත් ඉපැයුම් හෝ ගිණුම ක්‍රියාවිරහිත කරන ලද ගිණුමක් බවට පත්වීමට පෙර අවසන් වූ හෝ ඇති වූ කොන්ත්‍රාත්, ගිවිසුම් හෝ බැඳීම් යටතේ ලැබිය යුතු ගෙවීම් හෝ තුන්වන පාර්ශ්වයක් විසින් ඒ ගිණුම වෙත මාරු කරන ලද වෙනත් අරමුදල් ද යම් තැනැත්තකු විසින්, ක්‍රියාවිරහිත කරන ලද ගිණුමක් වෙත බැර කරනු ලැබිය හැකි ය.";

(ආ) (3) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් :-

"(3) කිසිම තැනැත්තකු විසින්, නම් කිරීමට පෙරාතුව යම් අවස්ථාවක දී, යම් තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් ක්‍රියාවිරහිත කරනු ලැබිය හැකි බවට සහ එමගින් ඉන් පසුව එකී අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් සඳහා ප්‍රවේශ වීම තහනම් කරනු ලබන බවට ඒ තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය වෙත දැනුම් දීම හෝ දැනුම් දීමට ඉඩ දීම හෝ දැනුම් දීමට කටයුතු සැලැස්වීම හෝ නොකළ යුතු ය:

එසේ වුවද, ඒ අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් ක්‍රියාවිරහිත කළ විගස ඒ පිළිබඳව නිසි බලධරයා විසින් ඒ තැනැත්තා, කණ්ඩායම හෝ අස්ථිත්වය වෙත දැනුම් දීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.";

(ඇ) (3) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(3අ) (අ) මේ නියෝග යටතේ වූ බැඳීමකට අනුව, (1) වන ඡේදය යටතේ ක්‍රියාවිරහිත කරනු ලැබීමට යටත් වූ අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් සහ ආර්ථික සම්පත් දරනු ලබන යම් තැනත්තකු විසින්, ඒ ක්‍රියාවිරහිත කිරීම ක්‍රියාත්මක වීමෙන් පසුව ස්වකීය අරමුදල්, වෙනත් මූල්‍ය වත්කම් හෝ ආර්ථික සම්පත් ක්‍රියාවිරහිත කරනු ලැබ ඇති තැනැත්තා වෙත ඒ ක්‍රියාවිරහිත කිරීම පිළිබඳව සහ එය ඉවත් කර ගැනීම සඳහා පවතින කාර්යපටිපාටිය පිළිබඳ ව දැනුම් දීමට සියලු සාධාරණ ප්‍රයත්න දරනු ලැබිය යුතු ය.

(ආ) ඒ අරමුදල් දරනු ලබන තැනැත්තා විසින්, මූල්‍ය බුද්ධි ඒකකය වෙත ද වහාම දැනුම්දීමක් කරනු ලැබිය යුතු ය. මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඒ කරුණ පිළිබඳව වහාම නිසි බලධරයා වෙත දන්වනු ලැබිය යුතු ය.

(ඇ) (අ) අනුඡේදය යටතේ වූ දැනුම් දීම, ඒ ක්‍රියාවිරහිත කිරීමේ දින සිට සති දෙකක් ඇතුළත ඒ ක්‍රියාවිරහිත කිරීම බලපාන තැනැත්තාගේ නෛතික නිත්‍ය පදිංචි ස්ථානය වෙත සිදු කරනු ලැබිය යුතු ය.

(ඈ) ක්‍රියාවිරහිත කිරීම බලපාන තැනැත්තා ශ්‍රී ලංකාවෙන් පිටත නිත්‍ය පදිංචියක් ඇති තැනැත්තකු නම්, ක්‍රියාවිරහිත කිරීම පිළිබඳ දැන්වීම, නිසි බලධරයා වෙත කරනු ලබන ඉල්ලීමක් මගින් ඒ ක්‍රියාවිරහිත කිරීම බලපාන තැනැත්තාගේ නිත්‍ය පදිංචිය ඇති රටෙහි ආණ්ඩුව වෙත, ඒ දැන්වීම භාර දෙන ලෙසට වන ඉල්ලීමක් ද සමග සපයනු ලැබිය යුතු ය.";

(ඈ) (4) වන ඡේදයේ "ක්‍රියාවිරහිත කිරීමේ නියමයක බලපෑම," යන වචන වෙනුවට, "ක්‍රියාවිරහිත කිරීමේ බලපෑම," යන වචන ආදේශ කිරීමෙන්;

(2) 6 වන නියෝගයේ (2) වන ඡේදයේ "ක්‍රියා විරහිත කිරීමේ නියමයකට යටත්ව" යන වචන වෙනුවට, "ක්‍රියාවිරහිත කිරීමට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන්;

(3) 8 වන නියෝගයේ (4) වන ඡේදයේ "ක්‍රියා විරහිත කිරීමේ නියමය" යන වචන වෙනුවට, "ක්‍රියාවිරහිත කිරීම" යන වචන ආදේශ කිරීමෙන්;

(4) 9 වන නියෝගයේ -

(අ) (1) වන ඡේදයේ (ආ) අනුඡේදයේ (i) වන අයිතමයේ "අරමුදල්වල තත්ත්වය, ක්‍රියා විරහිත කිරීමේ ක්‍රියාමාර්ග සහ" යන වචන වෙනුවට, "අරමුදල්වල තත්ත්වය, ක්‍රියාවිරහිත කිරීම සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) (2) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(3) (අ) යම් තැනැත්තකු හෝ තැනැත්තියක් විසින් දරනු ලබන යම් වත්කමක්, යම් නම් කරන ලද තැනැත්තකුට හෝ අස්ථිත්වයකට අයත් බවට හෝ යම් තැනැත්තකු හෝ අස්ථිත්වයක් විසින් පාලනය කරනු ලබන බවට හෝ යම් නම් කරන ලද තැනැත්තකු හෝ අස්ථිත්වයක් වෙනුවෙන් හෝ එවැන්නකුගේ විධානය පරිදි දරනු ලබන බවට හෝ එසේ විය හැකි බවට සැක කරන එකී තැනැත්තා හෝ තැනැත්තිය විසින්, එම සැකය සත්‍යාපනය කර ගැනීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය වෙත පිටපතක් ද සමඟ නිසි බලධරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) ඉල්ලීම කරනු ලබන තැනැත්තා දන්නා පරිදි වත්කම පිළිබඳ සහ ඒ වත්කමේ අයිතිකරු හෝ පාලනය කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර ද ඒ ඉල්ලීම සමඟ තිබිය යුතු ය.

(ඇ) නිසි බලධරයා විසින්, (අ) ඡේදය යටතේ ඉල්ලීම කරනු ලැබූ තැනැත්තකුට සහාය වීමට උපරිම ප්‍රයත්න යොදනු ලැබිය යුතු ය.

(ඈ) (අ) ඡේදය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු සාධාරණ ලෙස ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් නිසි බලධරයා හෝ මූල්‍ය බුද්ධි ඒකකය විසින් -

(i) නම් කරන ලද තැනැත්තකු හෝ අස්ථිත්වයක් විසින් එම දේපළෙහි අයිතිය දරනු ලැබීම හෝ පාලනය කරනු ලැබීම විය හැකි බවට;

(ii) නම් කරන ලද තැනැත්තකු හෝ අස්ථිත්වයක් විසින් එම දේපළෙහි අයිතිය දරනු ලැබීම හෝ පාලනය කරනු ලැබීම විය නොහැකි බවට; හෝ

(iii) නම් කරන ලද තැනැත්තකු හෝ අස්ථිත්වයක් විසින් එම දේපළෙහි අයිතිය දරනු ලබනවා ද පාලනය කරනු ලබනවා ද යන්න නොදන්නා බවට,

දක්වමින් ලිඛිතව ප්‍රතිචාර දක්වනු ලැබිය යුතු ය.";

(5) 11 වන නියෝගය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්: -

"**11.** (1) 5 වන නියෝගයේ (1) වන ඡේදයේ, 5 වන නියෝගයේ (2) වන ඡේදයේ (අ) අනුඡේදයේ හෝ 5 වන නියෝගයේ (4) වන ඡේදයේ විධිවිධාන කඩ කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී ඒ තැනැත්තා අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන සියයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) 4 වන නියෝගයේ (8) වන ඡේදයේ, 5 වන නියෝගයේ (2) වන ඡේදයේ (ආ) අනුඡේදයේ හෝ 5 වන නියෝගයේ (3) වන ඡේදයේ විධිවිධාන කඩ කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී, ඒ තැනැත්තා අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන පනහක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) 5 වන නියෝගයේ (3අ) වන ඡේදයේ හෝ 9 වන නියෝගයේ (1) වන ඡේදයේ (ආ) අනුඡේදයේ දැක්වෙන නියමයන්ට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී, ඒ තැනැත්තා අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(6) 13 වන නියෝගයේ -

(අ) "නෛතික තැනැත්තකු, කණ්ඩායමක් හෝ අස්ථිත්වයක් පාලනය කිරීම" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"""අස්ථිත්වය" යන්නට, යම් සංස්ථාගත හෝ සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක්, කණ්ඩායමක්, සංගමයක්, සංවිධානයක්, ආයතනයක් හෝ වැඩපිළිවෙළක් ඇතුළත් වේ;";

(ආ) "නෛතික තැනැත්තකුගේ, කණ්ඩායමක හෝ අස්ථිත්වයක අයිතිය දැරීම" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන්:-

"""තැනැත්තා" යන්නට නෛතික පුද්ගලභාවයක් ඇති හෝ නොමැති, යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු ඇතුළත් වන අතර ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද ඒ නෛතික තැනැත්තාගේ ශාඛාවක් ද ඇතුළත් විය යුතු ය;".

EOG 10 - 0166/1

---

**එල්.ඩී-බී. 7/2001(VI)**

**1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත**

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වන වගන්තිය යටතේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක කටයුතු පිළිබඳ අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**එච්. එම්. විජිත හේරත්,**
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය.

2026 ඔක්තෝබර් මස 09 වැනි දින,
කොළඹ දී ය.

**නියෝග**

2012 මැයි මස 31 වැනි දින අංක 1760/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2012 අංක 2 දරන එක්සත් ජාතීන්ගේ නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) 2 වන නියෝගයේ "ඇෆ්ගන් කණ්ඩායමට," යන වචන වෙනුවට "ඇෆ්ගන් කණ්ඩායමට," යන වචන ආදේශ කිරීමෙන්;

(2) 9 වන නියෝගයේ (1) වන ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන්;

"(1) නිසි බලධරයා විසින්, එසේ කිරීම සඳහා වූ තමාගේ අපේක්ෂාව පිළිබඳ සම්බාධක පැනවීමේ කමිටුව වෙත

දැනුම් දීමෙන් පසුව සහ සම්බාධක පැනවීමේ කමිටුවේ නියමයන්ට අනුකූලව ක්‍රියා කිරීමෙන් පසුව, එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුති 1452හි දක්වා ඇති කාර්යපටිපාටිවලට අනුකූලව, ඇතැම් වර්ගවල ගාස්තු, වියදම් සහ සේවා ගාස්තු ගෙවීම ඇතුළු මූලික වියදම් සඳහා අවශ්‍ය වන පරිදි, නිශ්චිත අරමුදල් නිදහස් කරගත හැකි වන පරිදි හෝ වත්කම් ලබා ගත හැකි වන පරිදි, 5 වන හෝ 6 වන නියෝගවල සඳහන් තහනම් කිරීමක් ඉවත් කිරීම සඳහා විශේෂිත බලය ලබා දීමක් ප්‍රදානය කරනු ලැබිය හැකි අතර, ඒ බලය ලබා දීම සම්බන්ධයෙන් උචිත කොන්දේසි නිසි බලධරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය.";

(3) 12 වන නියෝගයේ (2) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය එකතු කිරීමෙන්;

"(3) (අ) යම් තැනැත්තකු හෝ තැනැත්තියක් විසින් දරනු ලබන යම් වත්කමක්, යම් නම් කරන ලද තැනැත්තකුට හෝ අස්ථිත්වයකට අයත් බවට හෝ යම් තැනැත්තකු හෝ අස්ථිත්වයක් විසින් පාලනය කරනු ලබන බවට හෝ යම් නම් කරන ලද තැනැත්තකු හෝ අස්ථිත්වයක් වෙනුවෙන් හෝ එවැන්නකුගේ විධානය පරිදි දරනු ලබන බවට හෝ එසේ විය හැකි බවට සැක කරන එකී තැනැත්තා හෝ තැනැත්තිය විසින්, එම සැකය සත්‍යාපනය කර ගැනීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය වෙත පිටපතක් ද සමඟ නිසි බලධරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) ඉල්ලීම කරනු ලබන තැනැත්තා දන්නා පරිදි වත්කම පිළිබඳ සහ ඒ වත්කමේ අයිතිකරු හෝ පාලනය කරනු ලබන තැනැත්තා පිළිබඳ විස්තර ද ඒ ඉල්ලීම සමඟ තිබිය යුතු ය.

(ඇ) නිසි බලධරයා විසින්, (අ) ඡේදය යටතේ ඉල්ලීම කරනු ලැබූ තැනැත්තකුට සහාය වීමට උපරිම ප්‍රයත්න යොදනු ලැබිය යුතු ය.

(ඈ) (අ) ඡේදය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු සාධාරණ ලෙස ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් නිසි බලධරයා හෝ මූල්‍ය බුද්ධි ඒකකය විසින්-

(i) නම් කළ තැනැත්තකු හෝ අස්ථිත්වයක් විසින් එම දේපළෙහි අයිතිය දරනු ලැබීම හෝ පාලනය කරනු ලැබීම විය හැකි බව;

(ii) නම් කළ තැනැත්තකු හෝ අස්ථිත්වයක් විසින් එම දේපළෙහි අයිතිය දරනු ලැබීම හෝ පාලනය කරනු ලැබීම විය නොහැකි බව; හෝ

(iii) නම් කළ තැනැත්තකු හෝ අස්ථිත්වයක් විසින් එම දේපළෙහි අයිතිය දරනු ලබනවා ද පාලනය කරනු ලබනවා ද යන්න නොදන්නා බව,

දක්වමින් ලිඛිතව ප්‍රතිචාර දක්වනු ලැබිය යුතු ය.";

(4) 15 වන නියෝගය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන නියෝගය ආදේශ කිරීමෙන්:-

"**15.** (1) 5 වන නියෝගයේ හෝ 6 වන නියෝගයේ විධිවිධාන කඩ කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී, ඒ තැනැත්තා අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන සියයක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(2) 12 වන නියෝගයේ හෝ 13 වන නියෝගයේ දක්වා ඇති නියමයන්ට අනුකූලව කටයුතු කිරීම පැහැර හරිනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී, ඒ තැනැත්තා අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන විසිපහක් නොඉක්මවන දඩයකට හෝ ඒ බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) 14 වන නියෝගයේ විධිවිධාන කඩ කරනු ලබන යම් තැනැත්තකු වරදකට වරදකරු වන අතර, මහාධිකරණය විසින් වරදකරු කරනු ලැබීමේ දී, ඒ තැනැත්තා අවුරුදු දෙකක් නොඉක්මවන කාලසීමාවක් සඳහා බන්ධනාගාරගත කිරීමකට හෝ රුපියල් මිලියන පනහක් නොඉක්මවන දඩයකට හෝ එකී බන්ධනාගාරගත කිරීම සහ දඩය යන දෙකට ම හෝ යටත් විය යුතු ය.".

(5) 17 වන නියෝගයේ-

(අ) "අස්තිත්වය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""අස්තිත්වය" යන්නට, යම් සංස්ථාගත හෝ සංස්ථාගත නොකරන ලද මණ්ඩලයක්, කණ්ඩායමක්, සංගමයක්, සංවිධානයක්, ආයතනයක් හෝ වැඩපිළිවෙළක් ඇතුළත් වේ;";

(ආ) "තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""තැනැත්තා" යන්නට නෛතික පුද්ගලභාවයක් ඇති හෝ නොමැති, යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු ඇතුළත් වන අතර ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද ඒ නෛතික තැනැත්තාගේ ශාඛාවක් ද ඇතුළත් විය යුතු ය;".

EOG 10 - 0166/2

---

එල්.ඩී-බී. 7/2001(VI)

## 1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනත

1968 අංක 45 දරන එක්සත් ජාතීන්ගේ පනතේ 2 වන වගන්තිය යටතේ විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග.

**එච්. එම්. විජිත හේරත්,**
විදේශ කටයුතු, විදේශ රැකියා සහ සංචාරක අමාත්‍ය.

2026 ඔක්තෝබර් මස 09 වන දින,
කොළඹ දී ය.

**නියෝග**

2017 ඔක්තෝබර් මස 6 වන දින අංක 2039/32 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද 2017 එක්සත් ජාතීන්ගේ (කොරියානු ප්‍රජාතාන්ත්‍රික මහජන සමූහාණ්ඩුව සම්බන්ධයෙන් වන සම්බාධක) නියෝග පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) 2 වන නියෝගයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් නියෝගය ඇතුළත් කිරීමෙන් :-

"(2අ) මේ නියෝගවල අරමුණ වනුයේ, කොරියානු ප්‍රජාතාන්ත්‍රික මහජන සමූහාණ්ඩුව සම්බන්ධයෙන් වන 1718 (2006) දරන එක්සත් ජාතීන්ගේ ආරක්ෂක සභා යෝජනා සම්මුතිය සහ ඒ යෝජනා සම්මුතියට පසුව ගෙන එන ලද යම් යෝජනා සම්මුති බලාත්මක කරමින්, ජාත්‍යන්තර සාමයට සහ ආරක්ෂාවට තර්ජනයක් ඇති කරනු ලබන න්‍යෂ්ටික, රසායනික සහ ජීව විද්‍යාත්මක අවි මෙන්ම ඒවා යැවීමේ උපක්‍රම ව්‍යාප්ත වීමට අදාළව සම්බාධක ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා රජයට හැකියාව ලබා දීම වේ.";

(2) 19 වන නියෝගයේ (4) වන ඡේදයේ "(2) වන ඡේදයේ" සහ "නම් කළ අයිතම සහ නම් කළ සුඛෝපභෝගී අයිතම" යන වචන සහ ඉලක්කම් වෙනුවට පිළිවෙළින් "(3) වන ඡේදයේ" සහ "නම් කළ තැනැත්තන් සහ නම් කළ ආස්ථිත්‍ය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) 28 වන නියෝගයේ (2) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් :-

"(3) (අ) යම් තැනැත්තකු හෝ තැනැත්තියක් විසින් දරනු ලබන යම් වත්කමක්, යම් නම් කරන ලද තැනැත්තකුට හෝ ආස්ථිත්‍යකට අයත් බවට හෝ යම් තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් පාලනය කරනු

ලබන බවට හෝ යම් නම් කරන ලද තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් වෙනුවෙන් හෝ එවැන්නකුගේ විධානය පරිදි දරනු ලබන බවට හෝ එසේ විය හැකි බවට සැක කරන එකී තැනැත්තා හෝ තැනැත්තිය විසින්, එම සැකය සත්‍යාපනය කර ගැනීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය වෙත පිටපතක් ද සමඟ නිසි බලධරයා වෙත ලිඛිත ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) ඉල්ලීම කරනු ලබන තැනැත්තා දන්නා පරිදි වත්කම පිළිබඳ සහ ඒ වත්කමේ අයිතිකරු හෝ පාලනය කරනු ලබන තැනැත්තා පිළිබඳ තොරතුරු ද ඒ ඉල්ලීම සමඟ තිබිය යුතු ය.

(ඇ) නිසි බලධරයා විසින්, (අ) ඡේදය යටතේ ඉල්ලීම කරනු ලැබූ තැනැත්තකුට සහාය වීමට උපරිම ප්‍රයත්න යොදනු ලැබිය යුතු ය.

(ඇ) (අ) ඡේදය යටතේ ඉල්ලීමක් ලැබීමෙන් පසු සාධාරණ ලෙස ප්‍රායෝගිකව හැකිතාක් ඉක්මනින් නිසි බලධරයා හෝ මූල්‍ය බුද්ධි ඒකකය විසින්-

(i) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් එම දේපළෙහි අයිතිය දරනු ලැබීම හෝ පාලනය කරනු ලැබීම විය හැකි බව;

(ii) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් එම දේපළෙහි අයිතිය දරනු ලැබීම හෝ පාලනය කරනු ලැබීම විය නොහැකි බව; හෝ

(iii) නම් කළ තැනැත්තකු හෝ ආස්ථිත්‍යයක් විසින් එම දේපළෙහි අයිතිය දරනු ලබනවා ද පාලනය කරනු ලබනවා ද යන්න නොදන්නා බව,

දක්වමින් ලිඛිතව ප්‍රතිචාර දක්වනු ලැබිය යුතු ය.";

(4) 37 වන නියෝගයේ "තැනැත්තා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

"තැනැත්තා" යන්නට නෛතික පුද්ගලභාවයක් ඇති හෝ නොමැති, යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු ඇතුළත් වන අතර ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද හෝ පිහිටුවන ලද ඒ නෛතික තැනැත්තාගේ ශාඛාවක් ද ඇතුළත් විය යුතු ය;".

EOG 10 - 0166/3

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.